පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය: 10

විෂයය :- **භූගෝල විද්‍යාව**

පාසලේ නම : .................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 03 යි

## භූගෝල විද්‍යාව I, II

### භූගෝල විද්‍යාව - I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 10 තෙක් එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. වායුගෝලයේ අඩංගු වායු වර්ග අතුරින් වැඩිපුරම ඇත්තේ ........................................................ වායුවයි.

(නයිට්‍රජන් / කාබන්ඩයොක්සයිඩ් / ඔක්සිජන්)

02. ජෛව ගෝලයේ පැවැත්මට ඉතා වැදගත් වන ඕසෝන් ස්තරය .............................................. ගෝලය තුළ පිහිටා ඇත.

(පරිවර්ති / අපරිවර්ති / තාප)

03. පෘථිවි ව්‍යූහයට අනුව .................................. කොටස ඔලිවීයන් සහ සිලිකේට් යනාදි පාෂාණ සංයුතින්ගෙන් යුක්ත වේ.

(මහද්වීපික කබොල / පහළ ප්‍රාවරණය / ඉහළ ප්‍රාවරණය)

04. "දියළු පස" වඩාත් යෝග්‍ය වන්නේ .......................................... වගාව සඳහා ය.

(තිරිඟු / වී / පොල්)

05. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික මට්ටමින් කෙසෙල් වගාව ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්කය ලෙස .................................... හැඳින්විය හැකිය.

(කුරුණෑගල / කෑගල්ල / රත්නපුර)

06. ලෝකයේ ව්‍යාප්ත වී ඇති විශාල තැනිතලා අතුරින් නල්ලබෝර් තැන්න .................................. මහද්වීපය තුළ පිහිටා ඇත.

(අප්‍රිකා / යුරෝපා / ඕස්ට්‍රේලියා)

07. බෝඹුවල වී පර්යේෂණ ආයතනය ........................................... පළාත තුළ පිහිටා ඇත.

(වයඹ / බස්නාහිර / දකුණ)

08. විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආසියානු කලාපයේ ඉදිරියෙන් සිටින රට ............................................ යි.

(චීනය / ජපානය / ඉන්දියාව)

09. ශ්‍රී ලංකාවේ පිඟන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා උසස් වර්ගයේ .................................. නිධියක් මාතලේ රත්තොට ප්‍රදේශයේ ව්‍යාප්ත වී ඇත.

(කෙඔලින් / බෝලමැටි / මයිකා)

10. ශ්‍රී ලංකාවේ 1 : 50000 පරිමාණයට අනුව සිතියම් කොටස් 92 ට බෙදා ඇති අතර එවැනි එක් සිතියම් කොටසක ඇති භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් ...................................... කි.

(1000 / 10000 / 50000)

**අංක 11 සිට 15 දක්වා දී ඇති එක් එක් ප්‍රශ්නය කියවා බලා එය නිවැරදි නම් "නි" යන්න වටාද වැරදි නම් "වැ" යන්න " වටාද රවුමක් අඳින්න**

11. පෘථිවියේ මුළු මිරිදිය ජල පරිමාවෙන් 20% ක් පමණ භූගත ජලය ලෙස තැන්පත් වී ඇත නි/වැ
12. 19 වන සියවස අග භාගයේ ඇති වූ කාර්මික විප්ලවය නිසා යකඩ හා වානේ නිෂ්පාදන කර්මාන්ත ශීඝ්‍ර දියුණුවක් ඇතිවිය. නි/වැ
13. ලෝකයේ ස්වභාවික රබර් නිෂ්පාදනයෙන් 95% ක් සපයනු ලබන්නේ දකුණු හා අග්නිදිග ආසියාතික රටවල් ය. නි/වැ
14. ශ්‍රී ලංකාවේ 1 : 50000 සිතියම් නිර්මාණය සඳහා යොදා ගත් කොටුදූලේ ආරම්භක ලක්ෂණ (පදනම් මූලය) පිදුරුතලාගල කඳු මුදුන ලෙස ගෙන ඇත. නි/වැ
15. පිලිපීන දූපත් පැසිපික් සාගරයේ පිහිටි දූපත් සමූහයකි නි/වැ

- **අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. "අ" තීරුවේ ඇති තොරතුරු වල අනුපිළිවෙළට අනුව "ආ" තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

16.

| **"අ" තීරුව** | **"ආ" තීරුව** |
|---|---|
| භූ තැටිය | රට |
| 1. ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටිය | A. මැඩගස්කරය |
| 2. අප්‍රිකානු භූ තැටිය | B. බ්‍රිතාන්‍ය දූපත් |
| 3. යුරේසියානු භූ තැටිය | C. ශ්‍රී ලංකාව |
| | D. බ්‍රසීලය |

1. ADB 2. BCA 3. CAB 4. DAB (.............)

17.

| **"අ" තීරුව** | **"ආ" තීරුව** |
|---|---|
| මහද්වීපය | පිහිටා ඇති කඳු වැටිය |
| 1. ඕස්ට්‍රේලියා | A. ඇපනයින් |
| 2. යුරෝපා | B. ඇට්ලස් |
| 3. අප්‍රිකා | C. මහාබාධක |
| | D. ඇල්ප් |

1. ABC 2. BAC 3. CAB 4. CDB (.............)

18.

| **"අ" තීරුව** | **"ආ" තීරුව** |
|---|---|
| ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත | නිෂ්පාදන භාණ්ඩ |
| 1. පිඟන් මැටි | A. ඖෂධ |
| 2. පෙට්‍රෝ රසායන | B. ගුවන් විදුලි යන්ත්‍ර |
| 3. ගෘහ කර්මාන්ත | C. පිත්තල භාණ්ඩ |
| | D. දත් බෙහෙත් |

1. ACD 2. DAC 3. BCD 4. CAB (.............)

19.

| **"අ" තීරුව** | **"ආ" තීරුව** |
|---|---|
| රට | කාර්මික නිෂ්පාදන මධ්‍යස්ථාන |
| 1. ජපානය | A. ෂන්ෂුවාං |
| 2. ඇමරිකා එක්සත් ජනපදය | B. යොකොහාමා |
| 3. එක්සත් රාජධානිය | C. වේල්සය |
| | D. පිට්ස්බර්ග් |

1. ACD 2. CDB 3. BAC 4. BDC (.............)

20.

| **"අ" තීරුව** | **"ආ" තීරුව** |
|---|---|
| ධීවර කටයුතු හා සම්බන්ධ ස්ථාන | ධීවර කටයුතු |
| 1. මයිලවඩි | A. ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය |
| 2. පැලියගොඩ | B. ප්‍රධාන මාළු තොග වෙළෙඳපොළ |
| 3. කල්පිටිය | C. මසුන් ගොඩබාන ධීවර වරාය |
| | D. මසුන් වියළීම හා ඉස්සන් වගාව |

1. CBD 2. CBA 3. BDC 4. BAC (.............)

- **අංක 21 සිට 27 තෙක් ඇති ප්‍රශ්නවලට හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21. උතුරු ඇමරිකාවේ පිහිටි ...................................... විල ලෝකයේ විශාලතම විලයි.
22. ලෝකයේ වතු කෘෂිකාර්මික බෝගයක් ලෙස තේ වගාව මුලින් ම .................................... ජාතිකයන් විසින් හඳුන්වා දෙන ලදි.
23. ශ්‍රී ලංකාවේ කෘෂි අපනයනය ගම්මාන ඇති කිරීමේ වැඩ සටහන යටතේ ........................................ වගාව හා සම්බන්ධ අපනයන ගම්මානය ලෙස රාජාංගනය නම් කර ඇත.
24. වර්තමානයේ මෝටර් රථ නිෂ්පාදනය සඳහා ස්වයංක්‍රීය යන්ත්‍ර හා ...................................... යන්ත්‍ර වැනි යාන්ත්‍රික ශ්‍රමය බහුල ලෙස යොදා ගැනේ.
25. සෞම්‍ය කලාපයේ දක්නට ලැබෙන විශේෂිත දේශගුණික ලක්ෂණයක් ලෙස ....................................... දේශගුණය හැඳින්විය හැකිය.
26. බ්‍රසීලයේ නැගෙනහිර වෙරළබඩ පිහිටි ........................................ ගංගා නිම්නය ආසියාවෙන් බැහැරව වී වගා කරන ප්‍රධාන ප්‍රදේශයකි.
27. 1 : 50000 භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා මඟින් එම සිතියම් ප්‍රදේශයේ ................................. ලක්ෂණ පෙන්නුම් කෙරේ.

- **28 සිට 30 තෙක් දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා යාබද ශ්‍රී ලංකා සිතියම උපයෝගී කරගන්න.**



28. ශ්‍රී ලංකාවේ අගලවත්ත රබර් පර්යේෂණායතනය පිහිටි දිස්ත්‍රික්කය දක්වන අක්ෂරය ................................. ය.
29. ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් බෝ කරන මධ්‍යස්ථානයක් වන පදවිය පිහිටි දිස්ත්‍රික්කය දක්වන අක්ෂරය ........................... ය.
30. ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණය දිනාගත් ස්ථානයක් වන ආරුගම්බේ බොක්ක පිහිටි දිස්ත්‍රික්කය දක්වන අක්ෂරය ................. ය.

- **අංක 31 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හා වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

31. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් ශිලා ගෝලය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    1. මහද්වීප හා සාගර ශිලා ගෝලයේ පිහිටා ඇත.
    2. ශිලා ගෝලයෙන් ඇති සම්පත් සියල්ල ජීවී හා අජීවී වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.
    3. ශිලා ගෝලය ජීවීන්ගේ වාස භූමිය වේ.
    4. ව්‍යුහය අනුව ශිලා ගෝලය පෘථිවි කබොල හා පහළ ප්‍රාවරණය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. (...........)

32. "නිවර්තන " කලාපය ලෙස හැඳින්වෙන්නේ
    1. කර්කටක නිවර්තනයත් සමකයත් අතර කලාපයයි.
    2. කර්කටක නිවර්තනයත් මකර නිවර්තනයත් අතර කලාපයයි.
    3. මකර නිවර්තනයත් ඇන්ටාක්ටික් වෘත්තියත් අතර කලාපයයි.
    4. සමකයත් මකර නිවර්තනයත් අතර කලාපයයි. (...........)

33. ගොඩබිමින් සම්පූර්ණයෙන් වටවූ මුහුදු දෙක වන්නේ

1. මළ මුහුද හා රතු මුහුදයි
2. කැස්පියන් මුහුද හා එරල් මුහුදයි
3. එරල් මුහුද හා රතු මුහුදයි
4. කළු මුහුද හා කැස්පියන් මුහුදයි (...........)

34. ආසියානු කලාපයේ වාණිජ පදනමකින් තොරව වී වගා කරන රට කුමක්ද?

1. ඉන්දියාව
2. පකිස්තානය
3. බංගලාදේශය
4. වියට්නාමය (............)

35.
- 2000ml ට වැඩි වර්ෂාපතනය
- 27°C ක පමණ උෂ්ණත්වය
- කබොක් මිශ්‍ර රතු පස
- මඳ බෑවුම් සහිත ප්‍රදේශ

ඉහත සඳහන් භෞතික ලක්ෂණ වැදගත් වන්නේ කිනම් භෝග වර්ගයක් සඳහා ද

1. වී
2. තේ
3. රබර්
4. පොල් (............)

36. පරිවහනය සඳහා විල් ජලය භාවිතා කල හැකිවීම හා විල් අවටින් අමුද්‍රව්‍ය සපයා ගත හැකිවීම නිසා යකඩ හා වානේ කර්මාන්තය ස්ථාන ගත වූ රටකි.

1. ඇමරිකා එක්සත් ජනපදය
2. ජපානය
3. එක්සත් රාජධානිය
4. රුසියාව (...........)

37. එකලස් කිරීමේ කර්මාන්තයක මූලික ලක්ෂණ වන්නේ,

1. විශේෂ ප්‍රාගුණ්‍යය, ශ්‍රම විභජනය, බහු ජාතික සමාගම් ය.
2. තාක්ෂණික දියුණුව, විශේෂ ප්‍රාගුණ්‍යය හා ජාත්‍යන්තර සබඳතාය.
3. බහුජාතික සමාගම්, තාක්ෂණික දියුණුව හා ජාත්‍යන්තර සබඳතාය.
4. ශ්‍රම විභජනය, විශේෂ ප්‍රාගුණ්‍යය හා තාක්ෂණික දියුණුව (...........)

38. ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්ත යටතේ බීරළු හා රේන්ද නිෂ්පාදන සඳහා ප්‍රසිද්ධියක් උසුලනු ලබන්නේ,


1. පිළිමතලාව හා මහනුවර ප්‍රදේශයයි.
2. ගාල්ල හා මාතර ප්‍රදේශයයි
3. කළුතර හා ගාල්ල ප්‍රදේශයයි
4. ගාල්ල හා කොග්ගල ප්‍රදේශයයි (..........)

39. ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී ඇති පරිදි "පුරාණ නගර" සංචාරක කලාපයට අයත් නගර දෙකකි.

1. දඹුල්ල, කුරුණෑගල
2. සීගිරිය, නුවරඑළිය
3. කතරගම, අනුරාධපුරය
4. මහනුවර, නුවරඑළිය (..........)

40. යාබද රූප සටහනේ A - B රේඛාවෙන් දැක්වෙන්නේ

1. නෙරුවකි.
2. නිම්නයකි
3. කඳුවැටියකි
4. දිය බෙත්මකි (...........)




( B පත්‍රය සඳහා ලකුණු 1 x 40 = 40)

# භූගෝල විද්‍යාව I, II

## භූගෝල විද්‍යාව II

**උපදෙස් :- මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.**

**I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) යන කොටස් 3 ටම පිළිතුරු සැපයිය යුතුය.**

**II කොටසින් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සැපයිය යුතුය.**


### I කොටස

**01. (අ) ඔබ ශ්‍රී ලංකාවේ 1 :50000 මෙට්‍රික් සිතියම් පිළිබඳ ලබා ඇති දැනුම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

i. වර්තමානයේ භාවිතා කරන නව සිතියම් විද්‍යාත්මක ක්‍රම දෙකක් නම් කරන්න (ලකුණු 02)

ii. භූ ලක්ෂණ සිතියමක ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න (ලකුණු 02)

iii. පහත සටහනේ x ලකුණින් සඳහන් ප්‍රදේශයට අදාළ ජාතික මෙට්‍රික් ඛණ්ඩාංක ලියා දක්වන්න (ලකුණු 02)





iv. 1:50000 පරිමාණයට අනුව රේඛීය පරිමාණයක් ඇඳ දක්වන්න (ලකුණු 02)

v. පහත සඳහන් තොරතුරු නිරූපණයට භාවිත කරන සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් 1 : 50000 පරිමාණයට අනුව නිරූපණය කරන්න.

A. 4km ක් දුර A ශ්‍රේණියේ මහා මාර්ගයක්

B. $2km^2$ ක් විශාල කුඹුරු යායක් (ලකුණු 02)

**(ආ) පහත දැක්වෙන ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටු තුළ ලියන්න.**




| | |
|---|---|
| i | |
| ii | |
| iii | |
| iv | |
| v | |

(ලකුණු 05)

i. හිස්පැනියෝලා දූපත - A,B,C


ii. බාස් සමුද්‍ර සන්ධිය - D,E,F

iii. මෝටර් රථ කර්මාන්තයට ප්‍රසිද්ධ එක්සත් රාජධානිය - G,H,J

iv. නිවර්තන වර්ෂා වනාන්තරයක් ව්‍යාප්ත වී ඇති කොංගෝ ද්‍රෝණිය - K,L,M

v. යපස් නිධි ව්‍යාප්ත වූ ප්‍රදේශ අතරින් යුරල් ප්‍රදේශය - P,Q,R

**(ඉ) පහත දැක්වෙන ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියෙන් ඇති කොටු තුළ ලියන්න.**




(i) ☐

(ii) ☐

(iii) ☐

(iv) ☐

(v) ☐

(ලකුණු 05)

i. පිඟන් භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගන්නා කෙඔලින් මැටි නිධියක් ව්‍යාප්ත වී ඇති මීටියාගොඩ - A,B,C

ii. කලාඔය - D,E,F


iii. මීගමුව ධීවර වරාය - G,H,J

iv. ඩෙල්ෆ් දූපත - K,L,M

v. තලවකැලේ තේ පර්යේෂණ ආයතනය පිහිටි නුවරඑළිය දිස්ත්‍රික්කය - P,Q,R

## <u>II කොටස</u>

**02. යාබද රූප සටහනෙහි අංක 1,2,3 හා 4 න් දක්වා ඇත්තේ පෘථිවි වායුගෝලය බෙදා ඇති ස්ථර හතරයි.**




i. මෙම රූප සටහනට අනුව

a. පරිවර්තීගෝලය දක්වෙන අංකය කුමක්ද?

b. අපරිවර්තීගෝලය දක්වෙන අංකය කුමක්ද? (ලකුණු 02 යි)

ii. පරිවර්තීගෝලයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න (ලකුණු 03යි)

iii. a. ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වයට බලපාන ප්‍රධාන සාධක දෙක නම් කරන්න (ලකුණු 02 යි)

b. ජෛව ගෝලයේ සමතුලිතතාවය බිඳ වැටීම කෙරෙහි මිනිසාගෙන් එල්ලවන අහිතකර බලපෑම් නිදසුන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

- **අංක 03 සහ 04 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දක්වෙන ලෝක සිතියම භාවිත කරන්න.**




03. i. ඉහත ලෝක සිතියමේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය සඳහා වැදගත් වන රටවල් දෙකක් A හා B අක්ෂරවලින් දක්වේ. එම රටවල් දෙක පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

ii. ඉහත (i) හි නම් කරන ලද රටවල කිරි පට්ටි පාලනය දියුණුවීම කෙරෙහි බලපා ඇති සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. (a) ලෝකයේ තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ලෝක වෙළෙඳපළෙහි තිරිඟු ප්‍රධාන බෝගයක් ලෙස වැදගත් වීමට හේතු දෙකක් පැහැදිලි කරන්න (ලකුණු 03)

04. i. ඉහත ලෝක සිතියමේ කපු පිළි නිෂ්පාදනයට වැදගත්වන රටවල් දෙකක් C හා D අක්ෂර වලින් දක්වා ඇත. එම රටවල් දෙක පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

ii. කපු පිළි කර්මාන්තය ආශ්‍රිත නව ප්‍රවණතා තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

iii. (a) ආසියාතු රටවල නැව් තැනීමේ කර්මාන්තය දියුණුවට බලපා ඇති සාධක දෙකක් සඳහන් කරන්න (ලකුණු 02)

(b) ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය තුළ "බල ශක්තිය" ආශ්‍රිත පැන නැඟී ඇති ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

05. i. ලෝකයේ බොහෝ රටවල සිදු කෙරෙන විවිධ ආර්ථික කටයුතු අතුරින් කෘෂිකර්මාන්තයට වැදගත් ස්ථානයක් හිමිවේ. ඊට හේතු වී ඇති කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වී වගාව ආශ්‍රිතව දක්නට ලැබෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

iii. (a) ශ්‍රී ලංකාවේ තේ අපනයනය කරන ප්‍රධාන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(b) ශ්‍රී ලංකාවේ තේ වෙළඳාම හා සම්බන්ධ ගැටලු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 03)

06. i. කර්මාන්තයක් ස්ථානගත වීමට බලපාන සාධක දෙකක් දක්වන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තය ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන ද්‍රව්‍ය තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

iii. (a) ඛණිජ පාදක කර්මාන්ත ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු දෙකක් සඳහන් කරන්න (ලකුණු 02)

(b) ශ්‍රී ලංකාවේ විද්‍යුත් නිශ්පාදන කර්මාන්තය දියුණු කිරීම තුළින් ඇතිවන වාසි හා අවාසි මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 03)

07. i. ලෝකයේ වතු කෘෂි කර්මාන්තය ආශ්‍රිත විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ කෘෂි අංශය තුළ සුළු අපනයන භෝග වගාව කෙරෙහි රජය විශේෂ අවධානයක් යොමු කිරීමට හේතු තුනක් දක්වන්න. (ලකුණු 03)

iii. (a) ශ්‍රී ලංකාවේ පොල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා පිහිටුවා ඇති පර්යේෂණ ආයතන දෙක නම් කරන්න (ලකුණු 02)

(b) ශ්‍රී ලංකාවේ පොල් වගාව ආශ්‍රිතව වර්තමානයේ පැන නැගී ඇති ගැටලු දෙකක් දක්වා ඒවා විසඳීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 03)

08. i. ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තයේ නව ප්‍රවණතා දෙකක් දක්වන්න (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

iii. සංචාරක කර්මාන්තය තුළින් මෙරට ආර්ථික සංවර්ධනයට ලබාදෙන දායකත්වය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

# භූගෝල විද්‍යාව
# තෙවන වාර පරීක්ෂණය - 2023

## භූගෝල විද්‍යාව I
## ලකුණු දීමේ පටිපාටිය

1 - නයිට්‍රජන්

2 - අපරිවර්ති

3 - ඉහළ ප්‍රාවරණය

4 - වී

5 - රත්නපුර

6 - ඕස්ට්‍රේලියා

7 - බස්නාහිර

8 - චීනය

9 - කෙඔලින්

10 - 1000 $km^2$

11 - √

12 - x

13 - √

14 - x

15 - √

16 - 3

17 - 4

18 - 2

19 - 4

20 - 1

21 - සුපීරියර්

22 - චීන

23 - මිරිස්

24 - රොබොට්

25 - මධ්‍යධරණී

26 - ඇමර්සන්

27 - භූ විෂමතා

28 - H

29 - B

30 - E

31 - 4

32 - 2

33 - 2

34 - 3

35 - 3

36 - 1

37 - 4

38 - 4

39 - 1

40 - 1

## භූගෝල විද්‍යාව II
## ලකුණු දීමේ පටිපාටිය

I කොටස

(01) (අ) I.

- ගෝලීය ස්ථාන ගත කිරීමේ පද්ධති (GPS)
- භූගෝලීය තොරතුරු පද්ධති (GIS)
- දුරස්ත සංවේදන (RS)

II.

- භෞතික ලක්ෂණ හා ඒවා අතර සම්බන්ධතාව අවබෝධ කරගැනීමට හැකි වීම.
- ජල වහන රටා හා භූ විෂමතා පිළිබඳ අවබෝධය ලබා ගැනීමට හැකි වීම.
- භෞතික ලක්ෂණ හා මානුෂ කටයුතු අතර සබඳතාවය දැන ගැනීම.
- භූමි පරිභෝග රටා හඳුනා ගැනීම.

( P – 143 අනුව කරුණු 2 ක්)

III.

- 19 0000 ME
- 339 0000 MN

IV. නියමිත පරිමාණයට රේඛිය පරිමාණයක් ඇඳ දක්වා තිබීම.

V. අදාළ පරිමාණයට අනුව නියමිත සංකේත හා වර්ණ භාවිතා කරමින් තොරතුරු නිරූපණය කර තිබීම.

| (ආ) | | (ඉ) | |
|---|---|---|---|
| I | B | (1) | B |
| II | E | (2) | D |
| III | H | (3) | G |
| IV | M | (4) | L |
| V | R | (5) | Q |

(02) I. A අංක 4

B අංක 3

II.

- පෘථිවි පෘෂ්ටයේ සිට 8-12 km දක්වා ඉහළට විහිදී ඇත.
- උන්නතාංශය සමග උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ බැසීම/ පරිසර පතන සීඝ්‍රතාවයයි.
- සියලු කාලගුණික සංසිද්ධි (උෂ්ණත්වය, වර්ෂාපතනය, සුළඟ, ආර්ධතාවය) හට ගැනීම.
- ජෛව ගෝලයේ පැවැත්ම සඳහා පරිවර්තී ගෝලයේ ක්‍රියාකාරිත්වය වැදගත් විම.

(P 4 අනුව මෙවැනි ලක්ෂණ 3 ක් දැක්වීම)

(3) III. A ජෛව සාධක/ අජෛව සාධක

B වනාන්තර විනාශ කිරීම/ ගිනි තැබීම/ සත්ත්ව වාස භූමි විනාශ කිරීම/ ජෛව පද්ධති විනාශ වීම/ අවිධිමත් භූමි පරිහරණය සහ මතුපිට පස සෝදා යාම/ පරිසරයට කැළි කසල එකතු කිරීම/ජල මූලාශ්‍ර වලට අපද්‍රව්‍ය එකතු කිරීම

(P 10 අනුව මෙවැනි කරුණු 2ක් දැක්වීම)

(03) I. A නවසීලන්තය

B ඉන්දියාව

II.

- සිසිල් දේශගුණය පැවතීම.
- වෙනත් වගා කටයුතු සඳහා යොදාගත නොහැකි ආන්තික තෘණ බිම් ව්‍යාප්ත වී තිබීම.
- ජල පහසුකම්/ පුහුණු ශ්‍රමය/නව තාක්ෂණ වෙළඳපොළ

(ඉහත සාධක වලින් 3 දක්වා තිබීම)

III. A

- බිම් ඒකකයක අස්වැන්න අඩු වුවද ඒක පුද්ගල අස්වැන්න ඉහළ මට්ටමක පැවතීම.
- වගාබිම් විශාල වීම.
- දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය,
- ලොව පුරා පැතිරුණු වෙළඳ පොළක් පැවතීම.

(P 37 අනුව මෙවැනි ලක්ෂණ 2 දැක්වීම)

B

- ලෝක වෙළඳාම සබඳ වන ප්‍රධාන ධාන්‍ය වර්ගය වීම.
- ලෝක ජනතාවගේ බහුතරයකගේ ප්‍රධාන ආහාරය වීම.
- ව්‍යාපාර මට්ටමින් වගා කරන ධාන්‍ය වර්ගයක් නිසා වසර පුරා ලෝක වෙළඳපොළට තිරිඟු සැපයීමට හැකිවීම.
- තිරිඟු ආශ්‍රිත විවිධ ආහාර වර්ග සැකසීමට හැකි වීම.
- තිරිඟු ආශ්‍රිත අතුරුපල සත්ත්ව ආහාරයක් ලෙස යොදා ගැනීම.

(P 37 අනුව මෙවැනි කරුණු 2 ඇතුලත් විස්තර කර තිබීම)

(4) I. C ඊජිප්තුව

D බ්‍රසීලය

II.

- අතීතයේ අමුද්‍රව්‍ය ආනයනය කර කපු පිළි නිෂ්පාදනය කළ ද වර්තමානයේ කපු වගා කරන රට වල කර්මාන්තය පවත්වාගෙන යාම.
- 21 වන සියවසේ දෙවන බාගයේ සිට ආසියාතික රටවල් ප්‍රමුඛ වීම.
- යාන්ත්‍රික වීම හා තත්වයෙන් උසස් නිෂ්පාදන බිහි වීම.
- වෙනත් කෙඳි වර්ග සමග මිශ්‍ර කර ගුණාත්මක බවින් ඉහළ කපුපිළි නිෂ්පාදන කිරීම.
- පරිසර හිතකාමී නිෂ්පාදනයක් ලෙස පවත්වා ගෙන යාම.

(P - 108 අනුව මෙවැනි ප්‍රවනතා 3 ක් දක්වා තිබීම)

III. A

- නැව් නිෂ්පාදනයට අවශ්‍ය ලාභදායී ශ්‍රමය හා පුහුණු ශ්‍රමය පැවතිම.

- නව තාක්ෂණය උපරිම ලෙස යොදා ගැනීම.
- තටාක පහසුකම් සඳහා ජලය නොමිදෙන ගැඹුරු මුහුදු ප්‍රදේශ පැවතීම.

B

- ඛනිජ තෙල් මිල වෙනස් වීම.
- බලශක්ති සම්පත් ක්ෂය වෙමින් පැවතීම.
- බලශක්ති සම්පත් පවතින රටවල් දේශපාලන අරගල වලට මුහුණ දීම.
- න්‍යෂ්ටික බලශක්තිය නිසා සිදුවන පරිසර හානිය ඉහළ යාම.

(P - 101-111 අනුව මෙවැනි ගැටලු 3 ක් දක්වා තිබීම)

(5) I.

- ලෝක ජනතාවට ආහාර හා වෙනත් පාන වර්ග අවශ්‍යතා කෘෂි කර්මය තුළින් සැපයීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම.
- ලෝක ජනතාවගේ බහුතරයක් කෘෂි අංශයේ රැකියාවල නිරත වීම.
- ලෝක වෙළඳපොලේ කෘෂි නිෂ්පාදන සඳහා වැදගත් තැනක් ලැබීම.

(මෙවැනි හේතු 2 ක් සඳහන් කිරීම)

II.

- බස්නාහිර/සබරගමු පළාත්වලට අයත් දිස්ත්‍රික්ක හා ගාල්ල දිස්ත්‍රික්ක තුළ ව්‍යාප්ත වී ඇත.
- ගංගා මිටියාවත් හා පහත් බිම් වී වගා බිම් සඳහා යොදා ගැනීම.
- වර්ෂාපතනය මත වගාව සිදු කිරීම.
- අස්වනු ප්‍රමාණය වියළි කලාපයට සාපේක්ෂව අඩු වීම හා ජල ගැලීම් වලට භාජනය වීම.

(P - 52 අනුව මෙවැනි ලක්ෂණ 3 ක් දක්වා තිබීම)

III. A ඉරානය/ඉරාකය/එක්සත් අරාබි එමීර් රාජ්‍යය/ සිරියාව/ ජෝර්දානය/ රුසියාව/ එක්සත් රාජධානිය/ජපානය/ඕස්ට්‍රේලියාව

B

- ජාත්‍යන්තර වෙළඳපොලේදී මිල උච්චාවචනය වීම.
- තේ වගා කරන වෙනත් රටවලින් එල්ලවන තරඟය (කෙන්යාව)
- ගුණාත්මක බවින් අඩු නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළට ඉදිරිපත් කිරීම. (බාල තේ මිශ්‍ර කර)
- ආදේශක පාන වර්ග වලින් එල්ල වන තරඟය
- විදේශ වෙළඳපොළ ස්තාවර නොවීම.

(P - 78-79 අනුව මෙවැනි කරුණු 2 ක් ඇසුරින් පැහැදිලි කර තිබීම)

(6) I. බලශක්තිය/ප්‍රාග්ධනය/යටිතල පහසුකම්/රජයේ ප්‍රතිපත්ති/අමුද්‍රව්‍ය/වෙළඳපොළ /ශ්‍රමය

II. පැන්සල් කුරු/පොලිෂ්/තීන්ත වර්ග/ලිහිසි ද්‍රව්‍ය/වියලි කෝෂ අමුද්‍රව්‍ය/විදුලි උපකරණ/ජල බෝතල්

(P - 116 අනුව මෙවැනි නිෂ්පාදන 3 ක් දක්වා තිබීම)

III. A

- ඛණිජ කැණීම සඳහා අධික වියදමක් දැරීමට සිදු වීම.
- සේවක ගැටලු (සෞඛ්‍ය / අවධානම)

- ඛණිජ සම්පත් ක්ෂය වෙමින් පැවතීම.
- ඛනිජ කැණීම් වලදී පරිසරයට හානි සිදු වීම.
- වලවල් ආශ්‍රිත මදුරු උවදුර වැඩි වීම
- දේශීය කාර්මික අමුද්‍රව්‍යයන් ලෙස භාවිතය අඩු වීම.

(P - 122-124 අනුව මෙවැනි ගැටලු 2 ක් දක්වා තිබීම)

B <u>වාසි</u>

- විද්‍යුත් නිෂ්පාදන අපනයන තුළින් විදේශ විනිමය ලැබීම.
- විද්‍යුත් නිෂ්පාදන ආශ්‍රිත සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් නිර්මාණය වී තිබීම.
- විද්‍යුත් තාක්ෂණය පිළිබඳ විශේෂ දැනුම රට තුළට එකතු වීම.

**අවාසි**

- විද්‍යුත් උපාංග ආනයනය සඳහා විශාල මුදලක් වැය වීම.
- යල් පැන ගිය විද්‍යුත් උපාංග පරිසරයට එකතු කිරීම නිසා සිදුවන හානි.
- ජංගම දුරකථන වැනි විද්‍යුත් උපාංග නිරන්තර භාවිතය නිසා සෞඛ්‍යයට අහිතකර වීම.

(P - 123-124 අනුව මෙවැනි වාසි අවාසි දක්වා කෙටි හැඳින්වීමක් කිරීම)

(7) I.

- විශාල වතු වශයෙන් ව්‍යාප්ත වීම හා මුළු මනින්ම වානිජ ස්වරූපයක් ගැනීම.
- දේශීය ශ්‍රමය විදේශීය ශ්‍රමය භාවිතා කිරීම.
- පුහුණු ශ්‍රමය භාවිතය හා විධිමත් ශ්‍රම සංවිධානය
- විදේශ විනිමය ලබා දෙන අපනයන බෝග වීම.

(P - 40 අනුව මෙවැනි කරුණු 2 ක් දක්වා තිබීම)

II.

- සාම්ප්‍රදායික අපනයන වල මිල උච්චාවචනය වීම.
- තේ, පොල්, රබර්, වැනි බෝග කෙරෙහි පමණක් බලාපොරොත්තු තැබිය නොහැකි වීම.
- විදේශීය විනිමය පිළිබඳව ගැටලු මතු වීම.
- ලෝක වෙළඳපොළේ සුළු අපනයන බෝග වලට ඉල්ලුම වැඩි වීම.
- දේශීය ජනතාවගේ ආදායම් තත්වය වැඩි කරගත හැකි වීම.

(P - 64-65 අනුව මෙවැනි හේතු 3 ක් දක්වා තිබීම)

III. A ලුණුවිල/ඇඹිලිපිටිය

B <u>ගැටලු</u>

- පොල් වගා බිම් වෙනත් අවශ්‍යතා සඳහා යෙදවීම. (පොල් ඉඩම් කට්ටි කිරීම)
- පොල් වතු පැරණි වීම නිසා අස්වනු අඩු වීම.
- ජන සංඛ්‍යාව වැඩි වීමත් සමඟ නිවාස හා වෙනත් සංවර්ධන කටයුතු සඳහා පොල් ඉඩම් යොදාගැනීම.
- කම්කරු ගැටලු.
- දේශීය පරිභෝජනය වැඩි වීම නිසා අපනයනය සීමා වීම.
- විවිධ රෝග නිසා වගා බිම් විනාශ වීම.

<u>විසඳුම්</u>

- වියළි කලාපය හා මහවැලි ප්‍රදේශය තුළ නැවත පොල් වගා කිරීම.
- වැඩි අස්වනු ලබා දෙන කප්සෙත හා කප්සුව වැනි නව පොල් ප්‍රභේද හඳුන්වා දීම.
- නැවත පොල් වගාව සඳහා මූල්‍ය හා පොහොර සහනාධාර ලබා දීම.
- පර්යේෂණ කටයුතු පුළුල් කිරීම හා නිෂ්පාදන විවිධාංගීකරණයට යොමු වීම.

(P - 78-79 අනුව මෙවැනි ගැටලු හා විසඳුම් පිළිබඳව පැහැදිලි කර තිබීම)

(8) I.

- වෙනත් ලෝහ සමග මිශ්‍ර කර (ඇලුමිනියම්/තඹ) ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම.
- භාවිතයෙන් ඉවත් කළ පසු ප්‍රතිචක්‍රීකරණය කිරීම.
- යකඩ උණු කිරීම සඳහා ගල් අඟුරු වෙනුවට විකල්ප බල ශක්ති යොදාගැනීම.
- නැගෙනහිර ආසියාතික රටවල නව වෙළඳපොළ නිර්මාණය වීම.
- නව තාක්ෂණය යොදා ගනිමින් නිෂ්පාදන නවීකරණය වීම.

(P - 93 අනුව මෙවැනි ප්‍රවණතා 2 ක් දක්වා තිබීම)

II.

- ධනවත් සංචාරකයන් පැමිණීම සීමා වීම.
- සංචාරකයන්ගේ පැමිණීම වසරේ එක් කාලයකට පමණක් සිදුවීම.
- සංචාරක සේවාවල ගුණාත්මක භාවය රටපුරාසමානව පවත්වා ගත නොහැකි වීම.
- සංචාරක කර්මාන්තයට ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීම.
- සංචාරක කර්මාන්තය තුළින් සමාජ සංස්කෘතියට ඇති කරන බලපෑම්

(P - 135 අනුව මෙවැනි ගැටලු 3 ක් දක්වා තිබීම)

III.

- විදේශ විනිමය ගලා ඒම.
- සංචාරක කර්මාන්තය ආශ්‍රිත ඍජු හා වක්‍ර රැකියා නිර්මාණය වීම.
- දළ දේශීය නිෂ්පාදනය ඉහළ යාම.
- ප්‍රාදේශිය සංවර්ධනය ඇති වීම.
- දේශිය නිෂ්පාදනය සඳහා ජාත්‍යන්තර වෙළඳපොළක් නිර්මාණය වීම.
- ජනතාවගේ ජීවන තත්වය උසස් වීම.

(P - 133-135 අනුව මෙවැනි කරුණු 3 ක් ඇසුරින් පැහැදිලි කර තිබීම)



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න